දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ද්විතීය භාග 2015 ප්‍රථම වර පරීක්ෂණය - 2018 ජූලි/අගෝස්තු
achelor of Arts General (External) Degree Part II Regular Examination 2015 – July/August 2018

ඉසා 3.1 - ශ්‍රී ලංකා ඉතිහාසය (ක්‍රි.ව. 1796 සිට ක්‍රි.ව. 1948 දක්වා)
HYG 3.1 - History of Sri Lanka (From 1796 AD. to 1948 AD.)

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න
නො පැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ

---

01. ෆෙඩ්රික් නෝත්, තෝමස් මේට්ලන්ඩ් විසින් ඇති කරන ලද පරිපාලන ප්‍රතිසංස්කරණ පිළිබඳව සාකච්ඡා කරන්න.

02. "ශ්‍රී වික්‍රම රාජසිංහ රජුට තිබූ ජනතා පක්ෂපාතිත්වය නැතිවීම උඩරට රාජධානියේ පරිහානියට හා බිඳ වැටීමට ඉවහල් විය" විමසන්න.

03. 1818 නිදහස් සටනට තුඩුදුන් හේතු සාකච්ඡා කර, ඉන් උද්ගත වූ ප්‍රතිඵල සමාලෝචනය කරන්න.

04. ඩොනමෝර් කොමිසම මෙරටට පත් කිරීමට බලපෑ පසුබිම සාකච්ඡා කර, එකී යෝජනා මෙරට දේශපාලන පරිවර්තනයකට ඉවහල් වූ අන්දම පැහැදිලි කරන්න.

05. "දහනවවන සියවස තුළ වතු වගාවේ ව්‍යාප්තිය ආර්ථික ක්ෂේත්‍රයේ පමණක් නොව සමාජයේත් කැපී පෙනෙන වෙනසක් සිදු කළේය." ඉහත ප්‍රකාශයට ඔබ එකඟ වන්නේදැයි සහේතුකව කරුණු දක්වන්න.

06. බ්‍රිතාන්‍ය පාලන සමයේ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ අධිකරණ ක්‍රමය පිළිබඳව හැඳින්වීමක් කරන්න.

07. ශ්‍රී ලංකාවේ මධ්‍යම පන්තිය බිහිවූ අන්දම පැහැදිලි කර, 1930 දක්වා දේශපාලන බලතල දිනා ගැනීමට ඔවුන් අනුගමනය කළ ක්‍රියා මාර්ග සාකච්ඡා කරන්න.

08. නිදහසට පෙර ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ පහත දැක්වෙන ව්‍යාපාර අතුරින් **දෙකක්** (02) පිළිබඳව ඓතිහාසික සටහන් ලියන්න.
   I. බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරය
   II. අමද්‍යප ව්‍යාපාරය
   III. මැලේරියා මර්ධන ව්‍යාපාරය
   IV. පරම විඥානාර්ථ ව්‍යාපාරය
   V. හින්දු පුනර්ජීවන ව්‍යාපාරය

**********************************